229-18, Iteawon-dong, Youngsan-gu,
Seoul 140-202,
Republic of Korea

EMBASSY OF THE DEMOCRATIC SOCIALIST
REPUBLIC OF SRI LANKA

Ref : **<u>නීති විරෝධී ලෙස කොරියාවේ රැඳී සිටින ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් වෙත කෙරෙන කාරුණික නිවේදනයයි</u>**

දකුණු කොරියාවේ කම්කරු අමාත්‍යාංශය වීසා නොමැතිව නීති විරෝධී ලෙස කොරියාවේ රැඳී සිටින සියලු ශ්‍රමිකයන් නැවත ඔවුන්ගේ රටවල් වලට පිටත්කර යැවීම සඳහා ඉල්ලීමක් කර ඇත. තවද, කොරියාවේ කම්කරු අමාත්‍යාංශයේ රැකියා ප්‍රතිපත්ති කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් විසින්ද දැනට කොරියාවේ වීසා නොමැතිව නීති විරෝධී ලෙස රැඳී සිටින ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් මෙරටින් බැහැර කරන ලෙසට ඉල්ලීමක්ද කර ඇත.

දැනට ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් 18,000 ක් පමණ කොරියාවේ සේවය කරන අතර, එයින් 3000 ක් පමණ වීසා නොමැතිව නීති විරෝධී ලෙස රැඳී සිටින බව අප හට දන්වා තිබේ. මෙම සංඛ්‍යාව ඉතා විශාල වේ.

ශ්‍රී ලංකාව හා කොරියාව අතර පවතින ශ්‍රමිකයින් බඳවා ගැනීමේ ප්‍රතිපත්තිය මත දැනට ක්‍රියාත්මක වන රැකියා බලපත්‍ර ක්‍රමය (Employment Permit System) යටතේ ශ්‍රමිකයින්ට වසර 3 ක සේවා ගිවිසුමක් යටතේ සේවය කල හැකි අතර, වසර 3 නිම වුන පසුව ආයතන ප්‍රධානියාගේ කැමැත්ත මත තව වසර 3 කට සේවය සඳහා පැමිණීමට අවස්ථාව ඇත. සමහරවිට මෙම කාල සීමාව අවුරුදු 5 ක් වීමටද පුලුවන.

දැනට නීති විරෝධීව රැඳී සිටින ශ්‍රී ලාංකිකයන් මෙරටින් බැහැර නොකලහොත් වාර්ෂිකව අප රට වෙත ලබා දී ඇති රැකියා සලාකය (Employment Quota ) අඩු කිරීමට හෝ අත්හිටුවීමට හෝ සම්පූර්ණයෙන් නවතා දැමීමට සිදුවන බව කොරියාවේ කම්කරු අමාත්‍යාංශය මගින් වැඩිදුරටත් දන්වා ඇත.

එසේ වුනොත්, එය අප රටට සිදුවන විශාල පාඩුවකි. එසේම, කොරියාවේ රැකියාවක් බලාපොරොත්තුවෙන් සිටින ශ්‍රී ලාංකික සහෝදර, සහෝදරියන්ට සිදුවන මහත් අසාධාරණයකි. එය ශ්‍රී ලංකාවට අපකීර්තියකි.

එම නිසා, නීති විරෝධීව රැඳී සිටින ඔබට ශ්‍රී ලංකාවට ගොස් විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නැවත ලියාපදිංචි වී විභාගයට පෙනී සිට එය සමත් වී වසරකට පසුව නැවත කොරියාවට පැමිණීමට හැකිවේ. මෙහිදී, ඔබ මේ රටේ ලබා ගත් පලපුරුද්ද හා භාෂා දැනුම නිසා විභාගය පහසුවෙන් සමත් වී ඉතා ලෙහෙසියෙන් සහ ඉක්මනින් රැකියා අවස්ථාවක් ලබා ගැනීමට හැකි වනු ඇත. එහෙත්, වීසා නොමැතිව රැඳී සිට ආගමන විගමන දෙපාර්තමේන්තුවෙන් ඔබව අත් අඩංගුවට ගතහොත් නැවත වරක් කොරියාවට පැමිණීම එය බාධාවක් වනු ඇත.

තවද, මේ දිනවල නීති විරෝධී ලෙස රැඳී සිටින ශ්‍රමිකයන් අත් අඩංගුවට ගැනීම සඳහා විශේෂ මෙහෙයුමක් අරඹා ඇති බවද කම්කරු අමාත්‍යාංශය විසින් අප වෙත දන්වා ඇත.

එබැවින්, ඔබගේද රටේද උන්නතිය ගැන සිතා නැවතත් ශ්‍රී ලංකාවට ගොස් මෙහි පැමිණෙන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

අසිත පෙරේරා
තානාපති
දකුණු කොරියාව

Tel : (82-2) 735-2966, 735-2967
Fax: (82-2) 737-9577
E-mail : lankaemb@kornet.net
Website : www.srilankaembassy.net

ABBYY PDF Transformer 2.0
Click here to buy
www.ABBYY.com

229-18, Iteawon-dong, Youngsan-gu,
Seoul 140-202,
Republic of Korea

EMBASSY OF THE DEMOCRATIC SOCIALI
REPUBLIC OF SRI LANKA

Ref :

**Request to Sri Lankans who have "overstayed" or have "illegal" status in Korea**

The Ministry of Labour of Korea has requested 'sending' countries to help repatriate "overstays" or "illegal" back to country of origin. The Director General of the Employment Policy Bureau of the Ministry of Labour in Korea too has requested to us to send illegal Sri Lankan Migrant workers back to Sri Lanka.

At present, there are about 18,000 Sri Lankan migrant workers who are working in Korea. Out of them almost 3000 are living in Korea illegally with out a proper visa.

Under the EPS system Sri Lankan migrant workers can work in Korea for a three year period and after that, if the employer wishes to employ them further, they can come back for work for another three years. This may be changed to working in Korea for a total of 5 years.

Unless the "visa-less" Sri Lankans return to Sri Lanka the annual quota for the Sri Lankan workers allocated by the Ministry of Labour may be reduced or stopped altogether.

If it happens it will be a great injustice to the Sri Lankan youth who are waiting to get employment opportunities in Korea.

Therefore, we wish to inform that you can go back to Sri Lanka and come back to Korea after 3 years again if you wish through the proper process. For that, you have to be registered under the Sri Lanka Bureau of Foreign Employment, and successfully complete the KLT examination. As you have the knowledge of Korean language and the working experience in Korea it will be easier to get a another chance. But, if you get caught by the immigration you will be blacklisted and you will not be able to come back to Korea at all.

Therefore, we kindly appeal to all "visa-less" Sri Lankans to return to Sri Lanka and you may return to Korea upon successfully passing the KLT examination.

***Asitha Perera***
***Ambassador***
***South Korea***

Tel : (82-2) 735-2966, 735-2967
Fax: (82-2) 737-9577
E-mail : lankaemb@kornet.net
Website : www.srilankaembassy